# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
## ඇබෑර්තු

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පහත සඳහන් තනතුරු සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමග **2020** සැප්තැම්බර් මස **11** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. තමන් අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු ය. (මෙම තොරතුරු www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය).

**පාර්ලිමේන්තු කථා පරිවර්තක (සිංහල/ ඉංග්‍රීසි / සිංහල)**
**පාර්ලිමේන්තු කථා පරිවර්තක (සිංහල / දෙමළ/ සිංහල)**
**පාර්ලිමේන්තු කථා පරිවර්තක (ඉංග්‍රීසි/ දෙමළ/ ඉංග්‍රීසි)**

**1. වැටුප් පරිමාණය**

2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.47,340 -3x 755/13x 1,030 - 62,995 /- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 95,000.00 පමණ වේ.)

**2. වයස් සීමාව**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ 40 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**3. අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

පහත සඳහන් (අ) සහ (ආ) යටතේ සඳහන් කවර ආකාරයකට හෝ අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා ඇති අයදුම්කරුවන් හට ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්කළ හැකිය.

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කරන ආයතනයක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිළිගත් ආයතනයක් වෙතින් උපාධියක් ලබා තිබීම.

**පාර්ලිමේන්තු කථා පරිවර්තක (සිංහල/ ඉංග්‍රීසි / සිංහල) තනතුර සඳහා අයදුම්කරන අයදුම්කරුවන් සිංහල හෝ ඉංග්‍රීසි භාෂාව ද, පාර්ලිමේන්තු කථා පරිවර්තක (සිංහල/ දෙමළ / සිංහල) තනතුර සඳහා අයදුම්කරන අයදුම්කරුවන් සිංහල හෝ දෙමළ භාෂාව ද පාර්ලිමේන්තු කථා පරිවර්තක (ඉංග්‍රීසි / දෙමළ / ඉංග්‍රීසි) තනතුර සඳහා අයදුම්කරන අයදුම්කරුවන් ඉංග්‍රීසි හෝ දෙමළ භාෂාව ද උපාධිය සඳහා හදාරා තිබිය යුතුය**

සහ

අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය ගණිතය සහ උපාධිය සඳහා හදාරා නොමැති භාෂාව සඳහා සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 6 කින් සමත් වී සිටිය යුතුය.

සහ

ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් අනතුරුව රජයේ හෝ පිළිගත් ආයතනයක ගුරු වෘත්තිය, කථා පරිවර්තනය, භාෂා පරිවර්තනය සහ ජන සන්නිවේදනය වැනි භාෂා ආශ්‍රිත ක්ෂේත්‍රයක වසර දෙකකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

සහ

භාෂාවන් අතර අපහසුවකින් තොරව කථා පරිවර්තනය කිරීමේ හැකියාව

(ආ) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී (පැරණි නිර්දේශය) එකවර විෂයයන් 04ක් සමත් වී තිබීම හෝ නව නිර්දේශය යටතේ එකවර විෂයයන් 03ක් සමත් වී තිබීම

සහ

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය සහ අදාළ භාෂාවන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 6 කින් සමත් වී සිටිය යුතුය.

**පාර්ලිමේන්තු කථා පරිවර්තක (සිංහල/ ඉංග්‍රීසි / සිංහල) තනතුර සඳහා අයදුම්කරන අයදුම්කරුවන් සිංහල සහ ඉංග්‍රීසි භාෂාවන් සඳහා ද, පාර්ලිමේන්තු කථා පරිවර්තක (සිංහල/ දෙමළ / සිංහල) තනතුර සඳහා අයදුම්කරන අයදුම්කරුවන් සිංහල සහ දෙමළ භාෂාවන් සඳහා ද පාර්ලිමේන්තු කථා පරිවර්තක (ඉංග්‍රීසි / දෙමළ / ඉංග්‍රීසි) තනතුර සඳහා අයදුම්කරන අයදුම්කරුවන් ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවන් සඳහා ද සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතුය**

සහ

ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් අනතුරුව රජයේ හෝ පිළිගත් ආයතනයක ගුරු වෘත්තිය, කථා පරිවර්තනය, භාෂා පරිවර්තනය සහ ජන සන්නිවේදනය වැනි භාෂා ආශ්‍රිත ක්ෂේත්‍රයක වසර පහකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

සහ

භාෂාවන් අතර අපහසුවකින් තොරව කථා පරිවර්තනය කිරීමේ හැකියාව

**4.** බඳවා ගැනීමේ ක්‍රමය

ක්ෂණික කථා පරිවර්තන හා භාෂා පරිවර්තනය පිළිබඳ පරීක්ෂණ සහ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**සටහන : ඉහත 3 (අ) හෝ (ආ) යටතේ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් හට තමන් ඉල්ලුම් කරන ධාරාවට අදාල මාධ්‍ය භාෂාවන් අතර සමගාමීව කථා පරිවර්තනය කිරීමේ හැකියාව තිබීම අවශ්‍ය වන අතර සමගාමී කථා පරිවර්තනය පිළිබඳ සේවා පළපුරුද්දක් අත්‍යාවශ්‍ය නොවේ.**

**5. සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා සේවා කොන්දේසි**

(i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය. තෝරාගනු ලබන අයදුම්කරුවන් මුලින්ම වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිතත තනතුරක, සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරාගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතු ය. ඔවුන් වෛද්‍ය පරීක්ෂණයකට ද භාජනය විය යුතු ය.

(iv) තෝරාගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

**6.** අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඇ) වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික

**7.** රාජ්‍ය/ පළාත් රාජ්‍ය ආයතනවල සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතු ය.

**8.** තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුරු සඳහා නුසුදුසුකමක් වනු ඇත.

**9.** අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

**10.** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් හරහා එවනු නො ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඩබ්ලිව්. බී. ඩී. දසනායක
පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,

2020 අගෝස්තු මස 28 වැනිදා